www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ව්‍යසනකාරී භූමි කම්පාව පකිස්ථානයේ සහ ඉන්දියාවේ 20,000ක් මරා දමයි.

## Devastating quake kills 20,000 in Pakistan and India

පීටර් සිමන්ඩ්ස් විසිනි
2005 ඔක්තෝබර් 10

රිච්ටර් මාපකයේ 7.6ක් ලෙස සටහන් වූ දැවැන්ත භූමි කම්පාවක් ඉරිදා උතුරු දිග පකිස්ථානය පුරා නගර, කුඩා නගර සහ ගම්මාන විනාශ කර දැමී ය. නිල වසයෙන් නිකුත් වූ මරන සංඛ්‍යාව ඊයේ වන විට 19,369ක් වූ අතර තුවාල ලැබූ සංඛ්‍යාව 42,000 ඉක්මවී ය. කොටුවී ඇති ප්‍රදේශවලට මුදාගැනීමේ කන්ඩායම් යෑමත් සමග ම මෙම සංඛ්‍යාවන් තව දුරටත් ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන්දියාවේ පාලනය යටතේ ඇති කාශ්මීරයේ ද සිය ගනනක් මිය ගොස් තිබේ. රටවල් දෙකෙහි ම දරුනු ම ලෙස හානියට පත්ව ඇත්තේ මැටි ගඩොල් හා ලීයෙන් තැනුනු නිවාසවල වාසය කල දුගී ජනතාව ය. දැනට මත් හානියට පත්වූවන්ගේ සංඛ්‍යාවන් ඉහල නැගෙන තොරතුරු හෙලිවෙමින් තිබේ. පකිස්ථානය විසින් පාලනය කෙරෙන කාශ්මීරයේ (අසාද් කාශ්මීරය) සන්නිවේදන සහ වැඩ ඇමති තරික් ෆරූක් තම ප්‍රදේශයේ පමනක් 30,000ක් මිය ගොස් ඇති බව ඊයේ ප්‍රකාශ කලේ ය. ''එහි මුලුමනින් ම වැනසී ගිය ජනපද හා නගර ඇත. මුසාෆරාබාද් (අසාද් කාශ්මීරයේ ප්‍රාදේශීය අග නුවර) වැනසී ගොසිනි'' යැයි ඔහු පැවසී ය. මෙහි මරන සංඛ්‍යාව දැනට 11,000ක් ලෙස ගනන් බලා තිබේ.

ඉතා දැඩි ලෙස හානි වූ ප්‍රදේශය නම් මුසාෆරාබාදයට කි.මී. 40ක් ගිනිකොන දිගින් පිහිටා ඇති බාග් නම් වූ ප්‍රදේශය බවත් නගරය තුල හා ඉන් පිටත ගම්මානවල 6,000-7,000ත් අතර සංඛ්‍යාවක් මිය ගොස් ඇති බව ගනන් බලා ඇත. බාග් දිස්ත්‍රික්කයේ ''ජග්ලාරි, කුෆල්ගාර්, හරිගාල් සහ බනියාලි යන ගම්වල එක් අයෙක් වත් පන බේරා ගෙන නැත'' යි ඔහු ඉන්ටර්නැෂනල් නිව්ස් මාධ්‍ය ආයතනයට පැවසී ය. ''මිනිසුන් මහපොලව විසින් ගිලගෙන තිබෙනවා'' කාෂ්මීර කටයුතු ගැන ඇමති ෆයිසාල් හයාත් පැවසුයේ අසාද් කාශ්මීරයේ 24 ලක්ෂයක් වන ජනගහනයෙන් බාගයක් ම භූ චලනයේ බලපෑමට හසු වී ඇති බව යි.

හසාරාහි 7,000 ක් ද ඇතුලුව පකිස්ථානයේ වයඹ දිග දේශ සීමා ප්‍රදේශයේ 9,000 ක් මිය ගොස් ඇති බව විශ්වාස කෙරේ. බිලිවූවන් බොහෝ දෙනෙක් සෙනසුරාදා උදේ වරුවේ පන්තිවලට පැමින සිටි පාසල් ලමුන් ය. බලාකෝට් නුවර අඩුවසයෙන් පාසල් හයක් කඩා වැටීම නිසා සිය ගනනක් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එහි සිර වූහ. සුන්බුන්වල හිර වී සිටි ලමුන් බේරා ගැනීම සඳහා දෙමව්පියෝ ද ප්‍රදේශවාසීන් ද උදලු, සවලවලින් මෙන් ම සිය දෑත්වලින් ද සුන් බුන් ඉවත් කලහ. බලාකෝට් සහ අවට ගම්මාන හතක වැසියන් 2,500 ක් මිය ගොස් ඇති බව ගනන් බලා ඇත.

සිඩ්නි මෝනිං හෙරල්ඩ් පුවත්පතෙහි ලිපිය මෙසේ ප්‍රකාශ කලේ ය. ''බලාකෝට් ප්‍රදේශය විනාශයේ දර්ශනයක්. කොන්ක්‍රීට් නිවාසවලින් අඩක් පමන ම කඩා වැටී ඇත. මල සිරුරු තැන් තැන්වල වැටී තිබේ. උදව් නොමැතිකම ගැන නිවැසියෝ පැමිනිලි කලහ. නගරය දක්වා වැටී ඇති මාර්ගය නාය යෑමට ගොදුරු වී ඇති අතර නගරයට ලඟා විය හැක්කේ පා ගමනින් පමනකි. ''පකිස්ථානයේ අනතුරට ලක් වූ ප්‍රදේශවලින් සහන සේවකයින්ට ලඟා වීමට හැකිව ඇත්තේ සියයට 40කට පමනකි. ලක්ෂ ගනනක් නො වේ නම් දසදහස් ගනනක් දෙනාට නිවාස අහිමි වී ඇත. ඔවුන්ට ආහාර හෝ බෙහෙත් නැත. සමහර ප්‍රදේශවල බොහෝ දෙනා ධාරානිපාත වැසි හා කුනාටුවලට මැදි වී සිටිති.

භූමි කම්පාවේ නාභිය පිහිටන ලද්දේ මුසාෆරාබාද් නගරයට ආසන්න ප්‍රදේශයක වන අතර කම්පනය නව දිල්ලියේ සහ කාබුල් නුවර තරම් ඈත ප්‍රදේශවලට ද දැනුනි. භූමි කම්පාවට පසු රිච්ටර් මාපකයේ 6.2 ලෙස සටහන් වූ බරපතල පසු කම්පන 20ක් පමන සිදු විය. නැගෙනහිර ඇෆ්ඝනිස්ථානයේ නිවසෙහි කඩාවැටුනු මැටි බිත්තිවලට යට වීමෙන් කුඩා ලමුන් සතර දෙනෙක් මිය ගියහ.

පකිස්ථානයේ අගනුවර වන ඉස්ලාමාබාද්හි මාර්ගාලා ටවර්ස් නමැති තට්ටු පහකින් යුත් වෙලඳ සහ නිවාස සංකීර්නයට බරපතල හානි සිදු විය. තට්ටු පහෙන් දෙකක් කඩා වැටුනු අවස්ථාවේ දී අඩුවසයෙන් 35 දෙනෙක් මිය ගියහ. අභ්‍යන්තර අමාත්‍යාංශයේ විශේෂ නියෝග මත මෙහි අයිතිකරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ද ප්‍රාග්ධන සංවර්ධන අධිකාරයට ද එරෙහිව, ප්‍රමිතියෙන් පහල ගොඩනැගිලි ද්‍රව්‍ය පාවිච්චි කිරීමට එරෙහිව නඩුවක් පවරා ඇත. කම්පනයෙන්

වැනසී ගිය දුප්පතුන්ට අයත් මඩු වැනි ගනන් නැති කුඩා නිවාස වෙනුවෙන් එවැනි නීතිමය පියවරක් ගනු නොලැබේ.

ඉන්දියානු ජම්මු හා කාශ්මීර ප්‍රාන්තයේ සිදු වූ 700කට ආසන්න මරන සංඛ්‍යාවෙන් බොහොමයක් සිදු වූයේ පාකිස්ථාන හා ඉන්දියානු හමුදාව දැඩි ලෙස දෙපසෙහි ස්ථානගත කර ඇති පාලන රේඛාව සමීපයේ ය. ස්වදේශ අමාත්‍යංශය කියන පරිදි ඊයේ එලිවන ජාමයට මරන සංඛ්‍යාව 656කි -- මීට කාශ්මීර නිම්නයේ 589ක් ද ජම්මු ප්‍රදේශයේ 17ක් ද ඇතුලත් වේ. පාලන රේඛාව අසල කානා ප්‍රදේශයේ අවම වසයෙන් 258ක් මිය ගිය අතර පාකිස්ථානය ද කාශ්මීරයේ ඉන්දියාවෙන් පාලනය කරන කොටස් ද යා කෙරෙන මාර්ගයේ පිහිටි අවසාන ඉන්දියානු නගරය වන උරී හි තවත් 7 දෙනෙක් මියගියේ ය.

පාකිස්ථානයේ මෙන් ම මෙහි ද මිය ගිය හෝ තුවාල ලැබූවන් සංඛ්‍යාව තියුනු ලෙස ඉහල නගිනු ඇතැයි අපේක්ෂිත ය. ප්‍රාන්ත ආන්ඩු නිලධාරියෙකු හින්දුස්තාන් ටයිම්ස් වෙත මෙසේ පැවසී යඃ ''ටීට්වෝල් ප්‍රදේශයේ ගම්මාන 4කින් කිසිදු ප්‍රවෘත්තියක් නො ලැබෙන තතු තුල මරන සංඛ්‍යාව තවත් ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරේ.'' ටැන්ග්ධාර් නගරයේ පමනක් නිවාස 3,000ක් පමන විනාශ වුනු බව ඔහු කීය.

මෙම ව්‍යසනයෙන් කාශ්මීරය පිලිබඳව ඉන්දියාව හා පාකිස්ථානය අතර පවතින දශක ගනනක් පැරනි අර්බුදය අවසන් කිරීමට සහායක් වනු ඇතැයි මාධ්‍යය අනුමාන කර ඇත. සහන සේවා හා මුදා ගැනීමේ කටයුතුවලට ඉන්දියාවේ සහාය ලබා දීම සඳහා ඉන්දියානු අගමැති මන්මෝහන් සිං, පාකිස්ථානු ජනාධිපති මුෂාරෆ්ට දුරකථනයෙන් කතා කලේ ය. කෙසේ වෙතත්, ඛේදවාචකය මගින් නිර්මානය කෙරෙන සමාජ ආතතීන් වෙනතකට හැරවීමේ උපක්‍රමයක් ලෙස නව දිල්ලිය මෙන් ම ඉස්ලාමාබාදය ද කඩුව ලෙලවීමට උත්සාහ කරනු ඇත.

ඇත්ත වසයෙන් ම, මාර්ග බාධක හා මුර සංචාර ද ඇතුලත් භූ චලනයට හසු වූ ප්‍රදේශවල යොදා ඇති දැඩි මිලිටරි සීමාවන් රටවල් දෙකේ ම මුදා ගැනීමේ මෙහෙයුම්වලට බාධා පමුනුවා ඇත. මෙම ප්‍රදේශවල විශාල ලෙස හමුදාව යොදවා ඇත්තේ මිලිටරියට සිදු වූ හානියේ ප්‍රමානය -- අවම වසයෙන් පකිස්ථානුවන් 200ක් ද ඉන්දියානුවන් 50ක් ද වන හමුදා මරන -- බව එක් ඇඟවීමකි. උරී නගරයේ පාලනය සියතට ගෙන ඇති ඉන්දියානු හමුදාව මාධ්‍යට එහි පැමිනීම තහනම් කලේ ය. සහන සේවා හා මුදා ගැනීමේ මෙහෙයුම් ප්‍රමානවත් නොවන බව දිවි ගලවාගත්තවුන් හින්දුස්තාන් ටයිම්ස් වෙත පැමිනිලි කලහ.

## ආන්ඩුවේ අකර්මන්‍ය භාවය පිලිබඳ ක්ෂමාලාපය

සහන සේවාවල පැහැදිලි සීමා සහිතකම දූනට මත් පාකිස්ථානය තුල විවේචන අවුලුවා ඇත. ඉන්ටර්නැෂනල් නිව්ස් පුවත්පතේ ඉරිදා කතුවැකිය මෙසේ ප්‍රකාශ කලා යඃ ''කෙසේ වුවද ක්ෂේත්‍රයේ රජ කරන්නේ ව්‍යාකුලත්වයකි. හදිසි සේවා ක්‍රියාත්මක වෙද්දී සැලසුම්කරනයේ අඩුකම පැහැදිලිව පෙනීගියේ ය. මෙවැනි පරිමානයක ඛේදවාචකයකදී ක්‍රියාත්මක වීමට අවශ්‍ය තරමින් බලධාරීන් නුසූදානම්ව හා අවශ්‍ය කලමනා සම්පාදනයට නොහැකිව සිටි බව පැහැදිලි ය. සුන්බුන් යට සිර වී සිටියවුන් බේරා ගැනීමට වෙහෙස වූ සාමාන්‍ය ජනතාව පෙන්වූ කැප වීම හා ධෛර්යය පැහැදිලිව ම මෙහෙයුම් කාර්ය සාධනයට ආදේශකයක් නො වේ.''

ජනාධිපති මුෂාරෆ් හා ඔහුගේ ඇමතිවරු ''ඉස්ලාමාබාද් ව්‍යසනයට ක්ෂනිකව මැදිහත් වූ බව'' සඳහන් කරමින් මෙම පුවත්පත මුෂාරෆ් කෙරෙහි වරද පැටවීමෙන් වැලකීම සඳහා යුහුසුලු විය. ජාතික එකමුතුකම සඳහා කතාකරමින් කතුවැකිය අවසන් කලේ ''අපගේ ඉතිහාසයේ මෙම දුෂ්කර අවස්ථාවේ දී අපි සියලු දෙනාම ස්වභාවධර්මයේ මෙම කෲර ක්‍රියාවෙන් ඇති කල විනාශයට මුහුන පෑ ජනතාව ඉන් මුදා ගැනීම සඳහා එක සිතින් පෙල ගැසෙමු. වෙනත් ප්‍රශ්න හා පශ්චාත් මරන පරීක්ෂන අපි වෙනත් දිනයකට කල් තබමු.'' යනුවෙනි.

මුෂාරෆ් තන්ත්‍රය සඳහා ක්ෂමාලාප ගෙතීමේ දී ඩේලි ටයිම්ස් පුවත්පත වඩාත් ඉදිරියෙන් සිටියි. ''භූ චලනය පිලිබඳ නිවැරදි ඉදිරි දර්ශනයක්'' යන එහි කතු වැකිය මෙසේ ප්‍රකාශ කලා ය. ''ආන්ඩුව විවේචනයට ලක් කර ඇති රූපවාහිනී නාලිකාවන් මුදා ගැනීමේ මෙහෙයුම් හැකිතාක් ඉක්මනින් ආරම්භ නොකිරීමෙන් සරලව ම ආන්ඩුව භූ චලනයේ විනාශයට වගකිව යුතු ය යන අදහස පතුරුවා ලීමට අවිඥානිකව උදව් කර ඇත. සත්‍යය වන්නේ තුන්වන ලෝකයේ කොතැනක හෝ කිසිදු ආන්ඩුවක් විශේෂයෙන් ම ආන්ඩුවල මහා පරිමාන පශ්චාත් විපත් කලමනාකරනයකට සූදානම් විය නොහැකි බවයි.''

ඉහල මරන සංඛ්‍යාවට ප්‍රධාන වසයෙන් ම වගකිව යුත්තේ හෝ ප්‍රමිතියේ ඉදිකිරීම් හා දුර්වල ගොඩනැගිලි බව පෙන්වා දුන් විවේචකයන්ට කතු වැකියෙන් දොස් නැගී ය. එය තර්ක කලේ ගිනි ගැනීම් වැලැක්වීමේ නීති මෙන් නො ව ''භූ චලන සම්පූර්නයෙන් ම වෙනස් වූ ප්‍රවර්ගයක්'' බවයි. ''එය රැඳී ඇත්තේ එහි පරිමානය මත ය. ආර්ථික සුපිරි බලවතෙකු පවා ස්වාභාවික විපතක දී අසරන විය හැක. මෙවන් පරිමානයක ස්වභාවික ආපදාවන් දුර්ලභ වන අතර එයින් ආරක්ෂා

වීම සම්පූර්නයෙන් ම වාගේ කල නොහැක්කකි.'' එය තව දුරටත් පවසයි. ඉන්පසුව ලියුම්කරු පාකිස්ථානයේ මරන සංඛ්‍යාව, 2003 වසරේ 32,000කට මරු කැඳවමින් ඉරානයේ සිදු වූ භූමිකම්පාව හා 2001 වසරේ 11,500කට මරු කැඳවමින් ඉන්දියාවේ ගුජරාට් ප්‍රාන්තයේ සිදු වූ භූ කම්පනය සමග සංසන්දනය කරන්නේ තම තර්කයට සහාය පිනිස ය.

තැන තැන සිදු වන භූ චලනයන් නිවැරදිව පෙර දැකීම අසීරු බව සත්‍ය ය. එහෙත් සෙනසුරාදා චලනයට ලක් වූ කාශ්මීර හා උතුරු පාකිස්ථාන කලාපය යුරේසියානු හා ඉන්දියානු භූ තලයන් වෙන් කරන රේඛාවේ පිහිටා තිබෙන අතර නිරන්තරයෙන් සැලකිය යුතු කම්පනවලට භාජන වේ. විපත් සැලසුම්වල හා සුදුසු හදිසි සේවාවන්හි හිඟය ද දියුනු සන්නිවේදන හා ප්‍රවාහන සේවාවන් හෝ කම්පනයන්ට ඔරොත්තු දීමට සමත් ගොඩනැගිලි ඉදි කිරීමට අසමත් වීම පිලිබඳව සමාවක් ඇත්තේ නැත. සෑම වසරකදී ම මිල අධික හා නවීන අවි ආයුධවලින් සන්නද්ධ කල දැවැන්ත හමුදාවක් නඩත්තු කරමින් පාලන රේඛාව දිගේ ස්ථානගත කිරීම සඳහා ඉන්දියාව මෙන් ම පාකිස්ථානය ද ඩොලර් බිලියන ගනනින් වැය කරති.

තවද වග කිව යුත්තේ හුදෙක් ඉන්දියානු හා පාකිස්ථානු ආන්ඩු පමනක් නො වේ. දශක ගනනාවක යටත් විජිත පාලනයෙන් ද පසුව අධිරාජ්‍යවාදී බලවතුන්ගේ ආර්ථික සූරා කෑම මගින් ද මෙම දෙරටට ම උරුම කර දී ඇත්තේ ආර්ථික හා සමාජ පසුගාමීත්වය යි. දෙසැම්බර් 26 දා සුනාමියෙන් ඉක්බිති ව ඉන්දියානු උප මහාද්වීපයේ අතිශය දුගී මහ ජනතාවන්ගේ ඉරනම කෙරෙහි දක්වූ නොතැකීම හා පිලිකුල එක්සත් ජනපදයේ, යුරෝපා සංගමයේ හා අනෙකුත් ප්‍රධාන බලවතුන් යලිදු වතාවක් මෙහි දී ප්‍රදර්ශනය කර ඇත.

එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්, බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් හා අනෙකුත් ඊනියා ලෝක නායකයන් වංකකමේ දුගඳ හමන ප්‍රකාශයන් මගින් විපතට පත් වූවන් කෙරෙහි තම අනුකම්පාව ප්‍රකාශ කර ඇත. ඉන්දියාවේ සහ පාකිස්ථානයේ සහන සේවා කටයුතුවලට උපකාර කිරීමට අන්තර්ජාතික ආධාර ස්වල්පයක් ලබා දෙන බවට පොරොන්දු වී ඇත. වොෂින්ටනය මිලිටරි හෙලිකොප්ටර් යානා හා ඩොලර් ලක්ෂයක හදිසි ආපදා මුදලක් ඉදිරිපත් කර තිබේ: යුරෝපා සංගමය ඩොලර් මිලියන 3.8ක් පොරොන්දු වී ඇති අතර ඒ ඒ යුරෝපීය රටවල් මුදා ගැනීමේ කන්ඩායම් කිහිපයක් එවා ඇත. ඕස්ට්‍රේලියාව ඩොලර් 380,000ක් ද ලෝක බැංකුව ඩොලර් මිලියන 20ක් ද ඉදිරිපත් කොට ඇත. මෙම ආධාර ඇත්ත වසයෙන් ම ලැබුනත් විපතට පත් ලක්ෂ ගනන් ජනතාවගේ අවශ්‍යතා සපුරා ලීම සඳහා එය කිසි සේත් ම ප්‍රමානවත් නො වනු ඇත.

ඉරානය ඉන්දියාව හා ''ආර්ථික සුපිරි බලවතෙකුට පවා'' නොහැකි වූවා සේ ම පාකිස්ථානයට ද මෙවන් පරිමානයක ස්වාභාවික ව්‍යසනයක් හමුවේ කලහැකි දෙයක් නොමැති බව *ඩේලි ටයිම්ස්* පුවත්පත් කතුවැකියෙහි තර්කනය යි. මෙම තර්කය අවසාන වන්නේ කත්‍රිනා කුනාටුවට ගොදුරු වූවන් කෙරෙහි බුෂ් පරිපාලනය දක් වූ පිලිකුල්කටයුතු සතුරු ආකල්පය පිලිබඳ වක්‍රෝක්තියකින් එනම් එවැනි ව්‍යසනයකට මුහුන දීමට වොෂින්ටනයට ශක්තියක් නොතිබුනේ නම් ඉස්ලාමාබාදයෙන් ඊට වඩා සාර්ථකත්වයක් අපේක්ෂා කරන්නේ කෙසේ ද? මෙම ප්‍රකාශය සරලව ම පෙන්නුම් කරන්නේ සමස්තයක් ලෙස ලාභ පද්ධතියේ ඇති බංකොලොත් භාවය යි. එවැනි ව්‍යසනයක බලපෑම හැකිතාක් අවම කිරීම සඳහා තාක්ෂනය හා සම්පත් පවතින, සාමාන්‍ය වැඩ කරන ජනතාව ඔවුන් මුසාෆරාබාද්හි සිටියත් නිව් ඕර්ලියන්ස්හි සිටියත් ධනේශ්වර වෙලඳ පොල බලවේග යටතේ ඔවුන් ස්වභාවධර්මයේ බලවේගයන්ගේ අනසකට ඔහේ අත හැර දමා ඇති බවයි.

© www.wsws.org